මෛත්‍රීපාල සිරිසේන
MAITHRIPALA SIRISENA
හයවන විධායක ජනාධිපති
6TH EXECUTIVE PRESIDENT
පාර්ලිමේන්තු මන්ත්‍රී
MEMBER OF PARLIAMENT

2023 මාර්තු මස 22වන දින

**<u>මැතිවරණය කල්යාම හේතුවෙන් අපහසුතාවයට පත්ව ඇති අපේක්ෂක රාජ්‍ය සේවකයින් මුහුණ දී ඇති ගැටළු සම්බන්ධවයි.</u>**

ගරු ජනාධිපතිතුමණි,

2023 පලාත් පාලන මැතිවරණය නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වීම දේශපාලනමය වශයෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන පක්ෂයක් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිසිසේත් අනුමත නොකරන බව පළමුව ඔබතුමා වෙත අවධාරණය කර සිටිමු. එලෙසම රට සහ ජනතාව ඉතා අසීරු සහ අමාරු ජීවන අරගලයකට මුහුණ දෙමින් සිටින මේ අවස්ථාවේ රට පාලනය කිරීමේදී සහ ආර්ථිකමය වශයෙන් මුහුණ දෙන ගැටළු සහ අර්බුද කලමණාකරනය කර ගැනීමේදී ආණ්ඩුවකට සහ රජයට ප්‍රයෝගිකව මුහුණදිය හැකි අර්බුද රට පාලනය කල පක්ෂයක් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තේරුම්ගෙන සිටිමු.

ගරු ජනාධිපතිතුමණි, ඉහත සාධක එලෙසම තිබියදී අප විශේෂයෙන් අවධාරණය කරනු ලබන්නේ 2023 පළාත් පාලන මැතිවරණය සඳහා සියලුම දේශපාලන පක්ෂ නියෝජණය කරමින් අපේක්ෂකයින් වශයෙන් රාජ්‍ය සේවකයින් විශාල පිරිසක් ඉදිරිපත්වී ඇති බැවින් ඔවුන් සියළුම දෙනාට වැටුප් අහිමි වීම හේතුවෙන් බරපතල ආර්ථික දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුව ඇත. මෙම මැතිවරණය කල්යාමට හේතුව බවට ආණ්ඩුව සඳහන් කරනු ලබන්නේ රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවන බවයි. එම නිසා මාසිකව ඉතා සුළු වැටුපක් ලද රජයේ සේවකයන් වන මැතිවරණ අපේක්ෂකයින් හට මෙම ස්වාභාවය හා ඉදිරියට ඇදෙන මැතිවරණ ප්‍රමාද කාලය වැටුප් රහිතව කිසිසේත්ම දරා ගත නොහැකි බව අපගේ විශ්වාසයයි. එම නිසා සියලුම රාජ්‍ය සේවක මැතිවරණ අපේක්ෂයින් ඔවුන් මුහුණ දෙන මෙම අර්බුදකාරී තත්වයට රජය ලබාදෙන පිළිතුර කුමක්ද යන්න බලාපොරොත්තුවෙන් සිටින බව ඔබතුමාගේ අවධානයට යොමු කරමි.

ගරු ජනාධිපතිතුමණි, අප රටක් වශයෙන් මෙයට පෙරත් මෙවැනිම මැතිවරණ වලදී විවිධ නීතිමය හා ප්‍රායෝගික ගැටළු වලට මුහුණ දුන් අවස්ථාවලදී රාජ්‍ය සේවක මැතිවරණ අපේක්ෂකයින්ගේ වැටුප් සහ රාජකාරී කටයුතු ආවරණය කිරීම සම්බන්ධයෙන් විවිධ ප්‍රායෝගික හා නෛතික වශයෙන් වැදගත් තීරණ ගනු ලැබූ බව මාගේ අත්දැකීම සහ විශ්වාසය වේ. එම නිසා මෙහි සාධක අනුව 2023 පළාත් පාලන මැතිවරණයේ රාජ්‍ය සේවක අපේක්ෂකයින්ගේ තම ජීවිකාව ගෙනයාමේ ගැටළුවට පිළිතුරක් වශයෙන් ඔවුන්ගේ වැටුප ලබාදීමට සුදුසු නීතිමය පියවරක් ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

**මෛත්‍රීපාල සිරිසේන**
හයවන විධායක ජනාධිපති
පාර්ලිමේන්තු මන්ත්‍රී

C/79, හෙක්ටර් කොබ්බෑඩුව මාවත, කොළඹ 07
C/79,Hector Kobbekaduwa Road, Colombo 07
T: +94 112 081 225/6 F: +94 112 081 229
@Maithripalas
@maithripalaS
info@maithripalasirisena.lk
www.maithripalasirisena.lk
නව නගරය පාර, පොළොන්නරුව
New Town, Polonnaruwa
T: +94 272 222 301 F: +94 272 223 901